# ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය

ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ පසු පිටු
සකස් විය යුතු ආකාරය පිළිබඳ නියමුවක්

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය

ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ පසු පිටු
සකස් විය යුතු ආකාරය පිළිබඳ නියමුවක්

# ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය

## ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ පසු පිටු සකස් විය යුතු ආකාරය පිළිබඳ නියමුවක්

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2012

ප්‍රථම මුද්‍රණය 2002
දෙවන මුද්‍රණය 2003
තෙවන මුද්‍රණය 2012

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය ; ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ පසු පිටු සකස් විය යුතු ආකාරය පිළිබඳ නියමුවක්.-කොළඹ : ජාතික පුස්තකාලය හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2012
පිටු iv, 29 ; සෙ.මී. 21

ISBN 978-955-8383-78-0 මිළ : රු. 150.00
i. 070.5 ඩිවී 23 ii. ග්‍රන්ථ නාමය
1. පොත් ප්‍රකාශනය

ISBN 978-955-8383-78-0

මුද්‍රණය : සීපී ප්‍රින්ටර්ස්
අංක 204 සී, දුම්රියපොළ පාර,
උඩහමුල්ල, නුගේගොඩ.

ප්‍රකාශනය : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත
කොළඹ 07
දුරකථනය : 011-2687583, 011-2698847
ෆැක්ස් : 011-2687583, 011-2685201
ඊමේල් : nldsb@mail.natlib.lk

# පෙරවදන

පසුගිය වසර කිහිපය ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන ක්ෂේත්‍රයේ විශාල පිබිදීමක් ඇති වූ කාල වකවානුවක් ලෙස හැඳින්විය හැකිය. රජයේ ආයතන, පෞද්ගලික ආයතන පමණක් නොව කර්තෘවරුන් ම ප්‍රකාශකයන් ලෙස කල එළි බැසීම මෙම යුගයේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයකි. කෙසේ වෙතත්, ප්‍රකාශකයන්ගේ ප්‍රමාණාත්මක වර්ධනයට සාපේක්ෂව එහි ගුණාත්මක පක්ෂයෙහි වර්ධනය පහළ මට්ටමක පැවතීම අවධානයට ලක් කළ යුතු කරුණකි. ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රමිත ක්‍රියාමාර්ග භාවිත නො කිරීම බොහෝ ප්‍රකාශනවල දක්නට ලැබේ. ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ පසු පිටු සකස් වියයුතු සම්මත ආකාරය ඇතුළු සමස්ත සැකැස්ම පිළිබඳව සමහර ප්‍රකාශකයන් සතු අවබෝධය ප්‍රමාණවත් මට්ටමක නො පැවතීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත. විශේෂයෙන් කර්තෘ ප්‍රකාශනවල මෙම දුර්වලතා බහුලව දැකිය හැකිය.

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන ක්ෂේත්‍රයේ ගුණාත්මක උන්නතිය උදෙසා පසුගිය කාලය පුරා සක්‍රිය දායකත්වයක් සැපයූ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මෙම කරුණ කෙරෙහි සිය අවධානය යොමු කර ග්‍රන්ථ ප්‍රකාශනයට මාර්ග දර්ශකයක් ලෙස මෙම කෘතිය එළි දැක්වීමට කටයුතු කරන ලදී.

ලේඛකයින්, ප්‍රකාශකයින්, මුද්‍රණකරුවන් සහ ප්‍රකාශන ක්ෂේත්‍රයට සම්බන්ධ ආධුනිකයින්හට මෙම කෘතිය ඉතා ප්‍රයෝජනවත් වූ හෙයින් තෙවෙනි මුද්‍රණයක් ලෙස එළි දැක්වීමට කටයුතු කරනු ලබන්නේ ඉමහත් සතුටිනි. මෙම කෘතිය නැවත ප්‍රකාශයට පත් කිරීමේදි අවශ්‍ය මගපෙන්වීම හා උපදෙස් ලබාදුන් මණ්ඩලයීය අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) එන්. එච්. ඒම්. චිත්‍රානන්ද මහතාට, අධ්‍යක්ෂක නාලනි මල්ලවආරච්චි මහත්මියට, නියෝජ්‍ය අධ්‍යක්ෂ සේනානි බණ්ඩාර මහත්මියට, ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශයේ අංශ ප්‍රධාන ශ්‍රීමා සූරිය බණ්ඩාර මහත්මියට, ජී. එච්. මංගල මහතාට සහ සහාය දුන් සැමට මාගේ ස්තුතිය පුද කර සිටිමි.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන
සේවා මණ්ඩලය,
අංක 14, කොළඹ 07
2012 නොවැම්බර්

මහාචාර්ය සෝමරත්න බාලසූරිය
සභාපති

# පටුන


| | | |
|---|---|---|
| පෙරවදන | | v |
| පටුන | | vii |
| 1 | මුල් පිටු | |
| 1.1 | අර්ධ ග්‍රන්ථනාම පිටුව | 1 |
| 1.2 | අර්ධ ග්‍රන්ථනාම පිටුවෙහි පසු පිටුව | 3 |
| 1.3 | ග්‍රන්ථනාම පිටුව | 5 |
| 1.4 | ග්‍රන්ථනාම පිටුවෙහි පසු පිටුව | 8 |
| 1.5 | පිළිගැන්වීම | 14 |
| 1.6 | පෙරවදන | 14 |
| 1.7 | හැඳින්වීම | 14 |
| 1.8 | පටුන | 14 |
| 1.9 | කෙටි යෙදුම් | 16 |
| 2 | අන්තර්ගතය | |
| 2.1 | පිටු අංකනය කිරීම | 17 |
| 2.2 | දිවෙන ග්‍රන්ථනාමය | 17 |
| 2.3 | ග්‍රන්ථයෙහි ප්‍රමාණය හා කඩදාසි වර්ග | 18 |
| 2.4 | පිටුවෙහි සැකැස්ම | 19 |
| 3 | පසු පිටු | |
| 3.1 | උපග්‍රන්ථ | 21 |
| 3.2 | ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 21 |
| 3.3 | පාරිභාෂික පදමාලාව | 23 |
| 3.4 | සූචිය | 24 |
| 4 | අකුරු ප්‍රමාණ | 25 |
| 5 | පිටු අංක යෙදීම | 26 |
| 6 | පිටකවරය සකස් කිරීම | 28 |

# 1. මුල් පිටු

## 1.1 අර්ධ ග්‍රන්ථනාම පිටුව

මෙහි ග්‍රන්ථනාමය පමණක් සඳහන් කළ යුතුය.

නිදසුන් :

සංවාද කාව්‍ය සංග්‍රහය

උප ග්‍රන්ථනාමයක් හෝ සමාන්තර ග්‍රන්ථනාමයක් ඇත්නම් එය ග්‍රන්ථනාමයෙන් වෙන්ව හඳුනාගත හැකිවන සේ මුද්‍රණය කළ යුතු වේ.

නිදසුන් :

මිනිස් උපත

පරිණාමය සහ භෞතික නාම විද්‍යා

අධ්‍යයනයක්

## මුද්‍රණ උපදෙස්

ආදර්ශයේ දක්වා ඇති පරිදි මෙම පිටුවෙහි මැදින් (තරමක් ඉහළට වන සේ) ග්‍රන්ථ නාමය සඳහන් කරන්න. එසේ නොමැතිනම් පොත් සැලසුම්කරුගේ උපදෙස් පරිදි යෙදිය හැකිවේ. කෙසේ වෙතත්, ඉහළ සිට පහළට හෝ පහළ සිට ඉහළට කියැවෙන ආකාරයට යෙදීම නො කළමනාය.

# 1.2 අර්ධ ග්‍රන්ථනාම පිටුවෙහි පසු පිටුව

තත් කෘතියේ කර්තෘ, පරිවර්තක, සංස්කාරක හෝ සම්පාදක විසින් ලියා පළ කරන ලද වෙනත් කෘති 'කර්තෘගේ, පරිවර්තකගේ, සංස්කාරකගේ හෝ සම්පාදකගේ වෙනත් කෘති'යන ශීර්ෂය යටතේ ප්‍රකාශිත වර්ෂයත් සමඟ කාලක්‍රමාණුගතව (Chronologically) මෙම පිටුවෙහි සඳහන් කළ යුතුය. 'කර්තෘ පිටුව' හා 'දැන්වීම් පිටුව'ලෙස ද මෙම පිටුව හැඳින්වේ.

නිදසුන් (1) :

## කර්තෘගේ වෙනත් කෘති

| | |
|---|---|
| තක්සලාවේ නියඟය | 1986 |
| විමුක්තිය | 1987 |
| සිරකඳවුර | 1990 |
| තැනිතලාව | 1991 |
| රාජධානිය | 1992 |
| තාත්තා | 1993 |

විවිධ වර්ගවල කෘති වෙන වෙන ම ශීර්ෂ යටතේ කාලානුරූපීව දැක්වීම සුදුසුය. මෙහි දී කර්තෘ වඩාත් ම ප්‍රචලිත වී සිටින විෂය ක්ෂේත්‍රය අනුව විවිධ වර්ගවල විෂය අනුපිළිවෙළ සකස් කිරීම වඩාත් සුදුසුය.

නිදසුන් (2) :

## කර්තෘගේ වෙනත් කෘති

පද්‍ය

| | |
|---|---|
| හෙට ඉරක් පායයි | 1963 |
| මක්නිසාදයත් | 1964 |
| සක්වාලිහිණි | 1968 |
| බෝඩිම | 1970 |
| නොමියෙමි | 1973 |

නවකතා

| | |
|---|---|
| තුංමං හංදිය | 1967 |
| මනෝමන්දිර | 1971 |

පරිවර්තන

| | |
|---|---|
| ධවල සේනාංකය | 1956 |

නාට්‍ය

| | |
|---|---|
| සද්දන්ත හා තවත් නාටක | 1961 |
| මූදු පුත්තු | 1965 |

ළමා නාට්‍ය

| | |
|---|---|
| පුංචි අයට කයි කතන්දර | 1958 |
| කොටි වල්ගය | 1990 |

## 1.3 ග්‍රන්ථනාම පිටුව

### 1.3.1 ග්‍රන්ථනාමය

ප්‍රධාන ග්‍රන්ථනාමය පොතේ ප්‍රමාණයට ගැළපෙන සේ කැපී පෙනෙන අයුරින් පිටුවෙහි මැදක් ඉහළින් මුද්‍රණය කළ යුතුය. උප ග්‍රන්ථනාමයක් ඇත්නම්, එය ග්‍රන්ථනාමයට සාපේක්ෂව කුඩා ප්‍රමාණයේ අකුරු මගින් මුද්‍රණය කළ යුතුය. නොඑසේනම්, පොත් සැලසුම්කරුගේ උපදෙස් පරිදි මුද්‍රණය කළ හැකිය. කෙසේ වෙතත්, ග්‍රන්ථ නාමය පහළ සිට ඉහළට හෝ ඉහළ සිට පහළට හෝ කියැවෙන ආකාරයට යෙදීම නො කළමනාය.

නිදසුන් :

මැකීගිය අතීතය

අතීත සාම්ප්‍රදායික ජීවන රටාව - ක්‍රියාකරකම් - ක්‍රීඩා - කලා ශිල්ප

### 1.3.2 කර්තෘ

- කර්තෘ නාමය සඳහන් කරන්න.
- කර්තෘවරුන් කිහිපදෙනෙකුගේ දායකත්වය ග්‍රන්ථයට ලැබී ඇත්නම්, කෘතියෙහි අන්තර්ගතයට දක්වන ලද දායකත්වය අනුව ඔවුන්ගේ නම් අනුපිළිවෙළින් සඳහන් කරන්න.
- යම් ආයතනයක් ග්‍රන්ථයෙහි කර්තෘත්වය දරන්නේ නම්, එම ආයතන නාමය සඳහන් කරන්න.
- ග්‍රන්ථය සංස්කරණයක් හෝ සම්පාදනයක් නම්, සංස්කාරකගේ හෝ සම්පාදකගේ නම 'සංස්කරණය' හෝ 'සම්පාදනය' යන ශීර්ෂ යටතේ සඳහන් කරන්න.
- පරිවර්තනයක් හෝ අනුවර්තනයක් නම්, මුල් කර්තෘගේ නම මුලින් සඳහන් කොට පරිවර්තකගේ/අනුවර්තකගේ නම් 'පරිවර්තනය' හෝ 'අනුවර්තනය' යන ශීර්ෂ යටතේ සඳහන් කරන්න.
- කර්තෘ,පරිවර්තක,සංස්කාරක හෝ සම්පාදකගේ නාමය සමඟ ඔවුන් සතු උපාධි, ගරුනාම ආදිය අවශ්‍ය නම් සඳහන් කළ හැකිය.

නිදසුන් :

ආචාර්ය කේ. ජී. කරුණාතිලක
විද්‍යා විශාරද ඩිප්ලෝමා (ලංකා), බී. ඒ. ගෞරව (ලන්ඩන්)
පීඑච්.ඩී (කැලණිය)

### 1.3.3 ප්‍රකාශක

- ප්‍රකාශක නාමය සහ ප්‍රකාශන ස්ථානය පිළිවෙළින් සඳහන් කරන්න. ප්‍රකාශකට ලාංඡනයක් ඇත්නම් එය ප්‍රකාශක නාමයට ඉහළින් යෙදිය හැකිය.

නිදසුන් :

සාගර ප්‍රකාශකයෝ
කොළඹ

- කර්තෘ විසින් ම ග්‍රන්ථය ප්‍රකාශනය කරනු ලබයි නම්, 'කර්තෘ ප්‍රකාශනයකි' යනුවෙන් සඳහන් කරන්න.
- ග්‍රන්ථ නාමය, කර්තෘගේ නම හෝ සංස්කාරකගේ නම හෝ සම්පාදකගේ නම හා ප්‍රකාශකගේ නම අනිවාර්යයෙන් ම මෙම පිටුවේ ඇතුළත් විය යුතුය.

තිදසුන් :

**Expending Life Span in Humans through Reversing Ageing**
**LIFE SCIENCE SERIES - 2**

Dr. Ivan Samarawira
BSc (Ceylon) MSc (Penn State USA) PhD (Manitoba Canada)
World University Service Post Doctoral Research Fellow
University of Biringham, England
(Professor of Genetics)

Sarasavi Publishers

---

රෝබට් ඊ. හොවාඩ්
ඇක්විලෝනියාවේ කොනන්
**CONAN OF AQUILONIA**

සම්පූර්ණ හා අසංක්ෂිප්ත
සිංහල පරිවර්තනය
ප්‍රභාත් මිරිහාගල්ල

---

Magical Times in Ceylon / Sri Lanka

by
Nihal Kodituwakku

VIJITHA YAPA PUBLICATIONS

---

**VILLAGE FOLK TALES OF CEYLON**
VOLUME ONE
**H. PARKER**

ලංකාවේ
ගැමි ජනකතා
පළමු වෙළුම

එච්. පාකර්
පරිවර්තනය
චන්ද්‍ර ශ්‍රී රණසිංහ

සුරස පොතත්

165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ - 10

## 1.4 ග්‍රන්ථනාම පිටුවෙහි පසු පිටුව

### 1.4.1 අනුග්‍රහය පිළිබඳ ප්‍රකාශය

රජයේ හෝ වෙනත් ආයතනයක අනුග්‍රහයෙන් ග්‍රන්ථය ප්‍රකාශයට පත් කෙරේ නම්, ඒ බව සඳහන් කරන්න.

නිදසුන් :

| |
|---|
| මෙම කෘතිය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙන් මුද්‍රාපිතය. මෙහි අන්තර්ගතය මණ්ඩලයේ අදහස් පිළිබිඹු නො කරන බව සැලකුව මනාය. |

මුද්‍රණ උපදෙස්

අනුග්‍රාහක ප්‍රකාශය පොයින්ට් 10 ප්‍රමාණයේ අකුරුවලින් මුද්‍රණය කිරීම සුදුසුය.

### 1.4.2 කර්තෘ හිමිකම් ප්‍රකාශය

ඉංග්‍රීසි හෝඩියෙහි 'C' අක්ෂරය රවුමක් තුළ යොදා (©) ඊට ඉදිරියෙන් ප්‍රකාශන අයිතිය හිමි පුද්ගලයාගේ හෝ ආයතනයේ නම සහ ප්‍රකාශිත වර්ෂය සඳහන් කරන්න.

නිදසුන් :

© චින්තා ලක්ෂ්මි සිංහආරච්චි 2001

© ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය 1997

### 1.4.3 පුනර් මුද්‍රණ

ග්‍රන්ථය පුනර් මුද්‍රණයක් නම් වර්තමාන මුද්‍රණ වර්ෂය කර්තෘ හිමිකම් ප්‍රකාශය සඳහා යෙදිය යුතු අතර, පූර්ව මුද්‍රණ වර්ෂ ඊට පහළින් 'ප්‍රථම මුද්‍රණය', 'දෙවන මුද්‍රණය' වශයෙන් ශීර්ෂ යටතේ යෙදිය යුතුය.

නිදසුන් :

| | | |
|---|---|---|
| © චිත්‍රා ලක්ෂ්මි සිංහආරච්චි | | 2001 |
| ප්‍රථම මුද්‍රණය | - | 1988 |
| දෙවන මුද්‍රණය | - | 1997 |
| තෙවන මුද්‍රණය | - | 1999 |
| සිව්වන මුද්‍රණය | - | 2001 |

### 1.4.4 ග්‍රන්ථයෙහි කොටස් උපුටාගැනීම සම්බන්ධ ප්‍රකාශය

ග්‍රන්ථයෙහි කොටස් උපුටාගැනීම සම්බන්ධයෙන් කළ යුතු නිවේදනයක් ඇත්නම්, එය පො.08 අකුරු ප්‍රමාණයෙන් සඳහන් කිරීම මැනවි.

නිදසුන් :

මෙම කෘතියෙහි අයිතිය කර්තෘ සතුය. කර්තෘගේ ලිඛිත අවසරයකින් තොරව මෙහි එන කිසිවක් කවර අයුරකින් හෝ උපුටා පළ කිරීම සපුරා තහනම්ය.

### 1.4.5 සංස්කරණය පිළිබඳ ප්‍රකාශය

සංස්කරණය පිළිබඳ ප්‍රකාශය, 'පළමුවන සංස්කරණය', 'දෙවන සංස්කරණය', 'තෙවන සංස්කරණය', වශයෙන් ශීර්ෂ යටතේ අදාළ වර්ෂයන් සමග සඳහන් කරන්න.

නිදසුන් :

| | | |
|---|---|---|
| පළමුවන සංස්කරණය | - | 1960 |
| දෙවන සංස්කරණය | - | 1998 |
| තෙවන සංස්කරණය | - | 2000 |

## 1.4.6 අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN)

අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN) - මෙම අංකය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙහි ප්‍රකාශන අංශය විසින් නිකුත් කරනු ලැබේ. එම අංකය ලබා දෙන අවස්ථාවේ දී මණ්ඩලය විසින් සපයනු ලබන උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.

නිදසුන් : ISBN 978-955-20-4807-9

ස්වර ප්‍රස්තාර සහිත මුද්‍රිත සංගීත ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංකය (ISMN) ලබාගත යුතුය.

නිදසුන් : ISMN M 979-0-9006426-0-8

### මුද්‍රණ උපදෙස්

මෙම අංකය පොයින්ට් 12 ප්‍රමාණයේ අකුරුවලින් මුද්‍රණය කළ යුතු අතර එම අංකය ග්‍රන්ථනාම පිටුවෙහි පසුපිටුවේ සංස්කරණය පිළිබඳ ප්‍රකාශයට පහළින් හා පසුපස පිටකවරයේ දකුණු පසින් පහළ සිට අඟල් 01 ක් ඉහළින් මුද්‍රණය කළ යුතුය.

## 1.4.1 ප්‍රකාශනගත සූචිකරණ දත්ත

(Cataloguing-in Publication - CIP Data)

ප්‍රකාශනගත සූචිකරණ දත්ත (CIP Data) - මෙම තොරතුරු ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙහි සූචිකරණ අංශයෙන් ලබාගත හැකිය.

### මුද්‍රණ උපදෙස්

එම තොරතුරු සෙ.මී. 8X4 ක ප්‍රමාණයක කොටුවක් තුළ පොයින්ට් 8 ප්‍රමාණයේ අකුරුවලින් යෙදිය යුතුය. මණ්ඩලය විසින් ලබාදෙනු ලබන උපදෙස් එහි දී අනුගමනය කළ යුතුය.

නිදසුන් ඃ

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ඩිවි. මෙල්විල්

ඩිවි දශම වර්ගීකරණය 21 වන සංස්කරණය / මෙල්විල් ඩිවි; පරිවර්තනය උදිත අලහකෝන් විසිනි. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2012

පිටු xxiv, 320; සෙ.මී. 21. - ඩිවි දශම වර්ගීකරණය 21 වන සංස්කරණයේ සංක්ෂිප්ත පරිවර්තනයකි.

ISBN 978-955-8383-77-3 මිල : රු. 450.00

i. 025.431 ඩිවි 23 ii. ග්‍රන්ථ නාමය
iii. අලහකෝන්, උදිත පරි.
1. වර්ගීකරණය, ඩිවි දශම 2. පුස්තකාල විද්‍යාව

## 1.4.2 ග්‍රන්ථය සඳහා දායක වූවෝ

ග්‍රන්ථයෙහි පිටකවර සැලසුම්කරණය, පරිගණක අක්ෂර සංයෝජනය, ඡායාරූප, සිතියම්, මුද්‍රණය හා බෙදාහැරීම යන කාර්යය සඳහා දායක වූ පුද්ගල හෝ ආයතන නාම සහ ලිපින අදාළ ශීර්ෂ යටතේ සඳහන් කළ හැකිය. එකී ආයතන සුප්‍රකට ආයතන නම්, එම ආයතන නාමය හා පිහිටි නගරය පමණක් යෙදීම සෑහේ.

නිදසුන් :

ඡායාරූප : ඩී.බී. සුරනිමල

අක්ෂර සංයෝජනය : චාමර වර්ණයෝජකයෝ
නුගේගොඩ

පිටකවරය : සෝමසිරි හේරත්

ග්‍රන්ථය මුද්‍රණය කිරීම සහ අක්ෂර සංයෝජනය කිරීම එකම ආයතනයක් මගින් සිදු කර ඇත්නම් එය නැවතත් සඳහන් කිරීම අවශ්‍ය නොවේ. එවැනි අවස්ථාවල දී මුද්‍රණකරු පිළිබඳව පමණක් සඳහන් කිරීම ප්‍රමාණවත්ය.

නිදසුන් :

මුද්‍රණය : මල්මල් ප්‍රින්ටිස්
මහරගම

## 1.4.3 ප්‍රකාශක

ග්‍රන්ථය ප්‍රකාශයට පත් කර ඇත්තේ යම් ආයතනයක් මගින් නම්, එහි නාම සහ ලිපිනය සඳහන් කළ යුතු අතර ග්‍රන්ථය කර්තෘ විසින් ම ප්‍රකාශයට පත් කරන අවස්ථාවක 'කර්තෘ ප්‍රකාශනයකි' යනුවෙන් සඳහන් කළ යුතුය.

## 1.4.4 බෙදාහැරීම

ග්‍රන්ථය බෙදාහැරීම ප්‍රකාශක විසින් නොව වෙනත් ආයතනයක් මගින් සිදු කරයි නම්, එම ආයතනයේ නාම සහ ලිපිනය'බෙදාහැරීම' යන ශීර්ෂය යටතේ සඳහන් කළ හැකිය.

නිදසුන් :

බෙදාහැරීම : බුද්ධික පොත්හල
නුගේගොඩ.

# නිදසුන් :

ඇටවරිසා පල පිළිල

© ශිලාරත්න විජේසිංහ
ප්‍රථම මුද්‍රණය - 2011

විජේසිංහ ශිලාරත්න
ඇටවරිසා පල පිළිල / ශිලාරත්න විජේසිංහ
පිටු 226 ; සෙ.මී. 21

ISBN978 - 955-53737-0-3
i.891.483.ඩී.ඩී. 23 ii. ග්‍රන්ථ නාමය
1 සිංහල ප්‍රබන්ධ

පිටකවරය - සජිත විජේසිංහ

පරිගණක අකුරු ඇමිණුම - පසා ග්‍රැෆික්ස්
10/20, ...
කොළඹ - 11.

මුද්‍රණය - අසේප ග්‍රැෆික්ස්
... 

ප්‍රකාශනය - සරසි ප්‍රකාශකයෝ

ISBN 978 - 955 - 8672 - 56 - 3

ISBN 978 - 955 - 8672 - 56 - 3
i. 306.8743 ...

මුද්‍රණය - ...
අංක 221/7A, ...

© ලලිත් ...ආරච්චි 2012

ප්‍රථම මුද්‍රණය 2012 අගෝස්

ISBN978 - 955-95193 - 9 - 3 මිල රු. 150/-
i. 700.092 ඩී ඩී 23 ii. ග්‍රන්ථ නාමය

ISBN978 - 955-95193 - 9 - 3

මුද්‍රණය - ...
අංක 06 ...

ප්‍රකාශනය - ලලිත් ...ආරච්චි

අංක 96/29/1/1, ...
011 - 2012240, 077 - 3072494

© ...

2012
ISBN 978 - 955 - 96655 - 7 - 1

i.891.481. ඩී ඩී 23
1 සිංහල ...

ISBN 978 - 955 - 96655 - 7 - 1

ප්‍රථම මුද්‍රණය - 2012

3 ඩී, ...
081 - 4 940664, 4 940664, 0812 305722
e - mail : creativekandy@hotmail.com

## 1.5 පිළිගැන්වීම

පිළිගැන්වීම සංක්ෂිප්තව හා සරලව දැක්වීම සුදුසුය. මෙම පිටුවෙහි වෙනත් විස්තරයක් සඳහන් නො කළ යුතුය. (පිළිගැන්වීම සඳහන් පිටුවට පසු පිටුව හිස් පිටුවක් ලෙස තැබිය යුතුය.)

## 1.6 පෙරවදන

ග්‍රන්ථය පිළිබඳව කෙරෙන ශාස්ත්‍රීය විවරණයකි. එය කර්තෘගේ ඉල්ලීම පරිදි අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රවීණයෙකු විසින් ලියනු ලැබේ. පෙරවදන ලියන පුද්ගලයාගේ නම එහි අවසානයෙහි සඳහන් කළ යුතු අතර, ලිපිනය හා දිනය සඳහන් කළ යුතුය. අවශ්‍ය නම් විද්‍යුත් තැපැල් ලිපිනය හා වෙබ් අඩවිය ද සඳහන් කළ හැකිය. මෙය පූර්විකාව ලෙස ද හැඳින්වේ.

## 1.7 හැඳින්වීම

මෙය කෘතියේ කර්තෘ, සංස්කාරක, පරිවර්තක හෝ සම්පාදක විසින් ලියනු ලබන අතර, ග්‍රන්ථය නිර්මාණය කිරීමට පසුබිම් වූ කරුණු සහ ඒ සඳහා සහාය වූ අය පිළිබඳව තොරතුරු මෙහි ඇතුළත් වේ. හැඳින්වීම එක් පිටුවකට හෝ දෙකකට පමණක් සීමා වීම සුදුසුය. පිළිසඳර, ආමුඛය හා සංඥාපනය යන නම්වලින් ද මෙය හැඳින්වේ.

## 1.8 පටුන

- පෙරවදන, හැඳින්වීම සහ අනෙකුත් පරිච්ඡේද ඒවායේ නම් සහ අදාළ පිටු අංක සහිතව මෙහි ඇතුළත් කළ යුතුය

- ප්‍රධාන පරිච්ඡේද පමණක් පටුනෙහි දැක්විය හැකි අතර, අනුපරිච්ඡේද දක්වන්නේ නම් නිවැරදි අංක ක්‍රමයක් සහිතව පැහැදිලිව දැක්විය යුතුය. අනුපරිච්ඡේද, ඡේද හා අනුඡේද ඇතුළු විස්තරාත්මක පටුනක් ඇතුළත් කිරීම විශේෂයෙන් ම විෂයය පොත් සඳහා වඩාත් යෝග්‍ය වේ.

- සිතියම්, ඡායාරූප, රූපසටහන්, ආදිය ද පිටු අංක ද සමගින් වෙනමම පටුනක් ඇතුළත් කළ යුතුය.

නිදසුන් :

පටුන


පෙරවදන vi
හැඳින්වීම vii
පටුන x
කෙටි යෙදුම් xii

1. භාරතීය නාට්‍ය ඉතිහාසය
   1.1 භාරතීය නාට්‍ය කලාවේ ආරම්භය 1
   1.2 සංස්කෘත නාට්‍ය යුගය 9

2. උත්තර භාරතීය ජන නාට්‍ය කලාව
   2.1 උත්තර භාරතීය ජන කලාව පිළිබඳ හැඳින්වීම 15
   2.2 ප්‍රභවය හා විකාශය 17

3. උපග්‍රන්ථ 21
4. ආශ්‍රිත ග්‍රන්ථ 23
5. පාරිභාෂික පදමාලාව 25
6. අනුක්‍රමණිකාව 26

## 1.9 කෙටි යෙදුම්

ග්‍රන්ථයෙහි නිතර භාවිත වන දිගු වචන කෙටිකර දක්වීම සඳහා යොදන ලද සම්මත කෙටි යෙදුම් (හැකුළුම් පද) ලේඛනයක් සේ සකස් කොට දක්විය යුතුය. මෙය විශේෂයෙන් ශාස්ත්‍රීය ග්‍රන්ථ සඳහා අදාළ වේ.

නිදසුන් (1) :

| | |
|---|---|
| සෘග් | සෘග්වේද |
| කාද | කාදම්බරි |
| දශකු | දශකුමාරචරිතය |
| දිනි | දීඝනිකාය |
| පංච | පඤ්චතන්ත්‍රය |
| පධ | පරාශර ධර්මසංහිතා |
| බුච | බුද්ධ චරිත |
| මනු | මනුස්මෘති |

නිදසුන් (2) :

**Abbreviations**

| | |
|---|---|
| ADB | Asian Development Bank |
| AG | Auditor General |
| CEA | Central Environmental Authority |
| CIDA | Canadian International Development Agency |
| CM | Chief Minister |
| DAC | District Agricultural Committee |
| DCB | Decentralized Budget |
| DCC | District Coordinating Committee |

# 2. අන්තර්ගතය

## 2.1 පිටු අංකනය කිරීම

- මුල් පරිච්ඡේදය දකුණු පැත්තේ පිටුවකින් ආරම්භ කළ යුතුය.
- සෑම පිටුවක් ම නිවැරදිව හා පැහැදිලිව අංක කළ යුතුය.

## 2.2 දිවෙන ග්‍රන්ථනාමය

සෑම පිටුවක ම ඉහළින් ම පේළියේ දිවෙන ග්‍රන්ථ නාමය (Running Title) සඳහන් කළ යුතුය. දිවෙන ග්‍රන්ථ නාමය සාමාන්‍යයෙන් යොදනු ලබන්නේ ඉරට්ටේ අංක ඇති පිටුවල ග්‍රන්ථ නාමයත්, ඔත්තේ අංක ඇති පිටුවල පරිච්ඡේද නාමයත් වශයෙනි. පරිච්ඡේද නාම රහිත ග්‍රන්ථවල ඉරට්ටේ පිටුවල කර්තෘගේ නමත්, ඔත්තේ පිටුවල ග්‍රන්ථ නාමයත් යෙදිය හැකිය.

නිදසුන් :

| 2 භාරතීය නාට්‍ය ඉතිහාසය | සංස්කෘත නාට්‍ය යුගය 3 |
|---|---|
| | |

| 2 මහගමසේකර | තුංමං හංදිය 3 |
|---|---|
| | |

## 2.3 ග්‍රන්ථයෙහි ප්‍රමාණය හා කඩදාසි වර්ග

ග්‍රන්ථකරණයේ දී ශ්‍රී ලංකාවේ බහුල වශයෙන් භාවිත වන්නේ පහත සඳහන් කඩදාසි ප්‍රමාණයන්ය.

ඩිමයි 1/8 210mm x 140mm
ක්‍රවුන් 1/8 185mm x 120mm

මීට අමතරව පහත සඳහන් ප්‍රමාණයන් ද භාවිත වේ.

ඩිමයි 1/4 280mm x 210mm
ක්‍රවුන් 1/4 240mm x 180mm
සමත් ප්‍රමාණය 190mm x 140mm

පහත සඳහන් කඩදාසි වර්ග ග්‍රන්ථ මුද්‍රණයේ දී ශ්‍රී ලංකාවේ බහුලව භාවිත වේ.

80 gsm
70 gsm

පාඨ්‍ය ග්‍රන්ථ සහ නවකතා කෙටිකතා වැනි ග්‍රන්ථ සඳහා අවපුදු වර්ණ (off white) කඩදාසි භාවිත කිරීම වඩාත් යෝග්‍යය. මෙම කඩදාසි බරින් අඩු ඈපාරදෘශ්‍ය/විනිවිද නොපෙනෙන (opaque) කඩදාසි විය යුතුය.

## 2.4 පිටුවෙහි සැකැස්ම

සම්මත කඩදාසි ප්‍රමාණයට හා ඒ අනුව සැකසුන පොතේ ප්‍රමාණයට ගැලපෙන සේ පෙළ සහිත කොටස (text area) භාවිතා කළ යුතුය. එක් එක් ප්‍රමාණයේ උසට අකුරු අමුණා තිබීම ග්‍රන්ථය අශෝභන වීමට හේතුවක් වන බැවින් එකසමාන උසකින් සකස් විය යුතුය.

නිදසුන් :

| ග්‍රන්ථයේ ප්‍රමාණය | පෙළ සහිත කොටස (text area) |
|---|---|
| ඩිමයි 1/8 | පළල අඟල් 04 සහ උස අඟල් 07 |

පෙළ සහිත කොටස (text area) හි උස දිවෙන ග්‍රන්ථ නාමය ද පාද සටහන් ද (footnotes) ද ඇතුළුව අඟල් 07 ක් විය යුතුය.

- පිටු අංක හෝ දිවෙන ග්‍රන්ථ නාමයත් පෙළ සහිත කොටසත් (text area) අතර එක් අකුරු පේළියක ඉඩක් තැබිය යුතුය.
- පේළි අතර තැබිය යුත්තේ එක් පේළි ඉඩක් (one line space) පමණි.
- වචන අතර අකුරු භාගයක ඉඩක් පමණක් තැබිය යුතුය.
- ඡේද අතර ඉඩ නො තැබිය යුතුය.
- මාතෘකා හා උප මාතෘකාවලට පෙර පොයින්ට් 12 ක ඉඩ ප්‍රමාණයක් තැබිය යුතු අතර මාතෘකා හා උප මාතෘකාවලට පසු පොයින්ට් 06 ක ඉඩක් තැබිය යුතුය.
- සෙරිෆ් අකුරු පමණක් භාවිත කළ යුතුය.
- පාඨ්‍ය ග්‍රන්ථ හා නවකතා කෙටිකතා වැනි ග්‍රන්ථ සඳහා ආර්ට් පේපර් (art paper) කඩදාසි භාවිත නො කළ යුතුය.

- පාද සටහන් (footnotes) දැක්වීමේ දී ඒ ඒ පිටුවෙහි අගට හෝ ඒ ඒ පරිච්ඡේදයෙහි අගට හෝ සඳහන් කළ යුතුය. සෑම පිටුවක ම අවසානයේ පාද සටහන් යෙදීම වඩාත් සුදුසුය. පාද සටහන්හි අකුරුවල ප්‍රමාණය අන්තර්ගතය සඳහා යෙදූ අකුරු ප්‍රමාණයට වඩා කුඩා විය යුතුය. ඉරක් යෙදීම මගින් හෝ අන්තර්ගතය හා පාද සටහන් අතර අකුරු පේළි එකක ඉඩක් තැබීම මගින් හෝ පාද සටහන් අන්තර්ගතයෙන් වෙන් කොට දැක්විය යුතුය.

- පාද සටහන් පිටුවෙන් පිටුවට, 1-සිට අංකනය කළ හැකි අතර, පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට ද අංකනය කළ හැකි වේ. පරිච්ඡේද-යෙන් පරිච්ඡේදයට ද පාද සටහන් සඳහා අංක යෙදීම වඩාත් සුදුසුය.

# 3. පසු පිටු

## පසු පිටු අනුපිළිවෙළ


3.1 උපග්‍රන්ථ

3.2 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

3.3 පාරිභාෂික පදමාලාව

3.4 සූචිය


## 3.1 උපග්‍රන්ථ

පරිශිෂ්ටය ලෙස ද මෙය හැඳින්වේ. අන්තර්ගතයට සෘජු සම්බන්ධයක් නොමැති නමුත් එහි අදහස වඩාත් පැහැදිලි කිරීමට වැදගත් වන ලිපිලේඛන උපග්‍රන්ථය යටතේ දැක්විය හැකිය.

## 3.2 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

- අන්තර්ගතයෙහි උපුටා ගැනීම් සඳහන් කර ඇති අනුපිළිවෙළට ආශ්‍රිත ග්‍රන්ථ සඳහන් කළ යුතුය.
- අන්තර්ගතයෙහි උපුටා ගැනීම් සඳහන් කර නොමැතිනම්, ආශ්‍රිත ග්‍රන්ථ සඳහන් කළ යුත්තේ කර්තෘ නාමයෙහි අකාරාදි පිළිවෙළට වේ.
- විවිධ භාෂාවන්ට අයත් ප්‍රකාශන ඇත්නම් (සිංහල, දෙමළ, ඉංග්‍රීසි හා වෙනත් භාෂාවන්ට අයත් ප්‍රකාශන) ඒ ඒ භාෂාව යටතේ වෙන් වෙන් වශයෙන් ආශ්‍රිත ග්‍රන්ථ සඳහන් කළ යුතුය.
- විවිධ වර්ගවල ප්‍රකාශන, උදාහරණ වශයෙන් පොත්, වාර සඟරා, වෙබ් අඩවි, ආදිය වෙන් වෙන් වශයෙන් දැක්වීම සුදුසුය.
- ආශ්‍රිත ග්‍රන්ථ දැක්වීමේ දී පහත දැක්වෙන පරිදි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සඳහන් කළ යුතුය. මෙම තොරතුරු දක්වන ක්‍රම කිහිපයක් ඇති නමුත් එක් කෘතියක් සඳහා භාවිත කළ යුත්තේ එක් ක්‍රමයකි. විවිධ ක්‍රම මිශ්‍රව භාවිත කිරීම නුසුදුසුය.

පොත්

ක්‍රමය (1) කර්තෘ, ග්‍රන්ථ නාමය, සංස්කරණය, ප්‍රකාශක, ප්‍රකාශන ස්ථානය, වර්ෂය

නිදසුන් : මුනිදාස, කුමාරතුංග, ළමා ගී, ඇම් . ඩී. ගුණසේන, කොළඹ, 2001

ක්‍රමය (2) කර්තෘ, ප්‍රකාශිත වර්ෂය, ග්‍රන්ථ නාමය, සංස්කරණය, ප්‍රකාශක, ප්‍රකාශන ස්ථානය

නිදසුන් : මුනිදාස, කුමාරතුංග (2001) ළමා ගී, ඇම්. ඩී. ගුණසේන, කොළඹ

වාර සඟරාවකින් උපුටා ගැනීමේ දී

ක්‍රමය (1) කර්තෘ, ලිපිනාමය, සඟරාවේ නම, වෙළුම හා අංකය, ප්‍රකාශිත වර්ෂය, අදාළ පිටු අංක

නිදසුන් : අමරසේකර, ගුණදාස, මාර්ටින් වික්‍රමසිංහ හා සිංහල සිනමාව, **සදිසි**, 01 කාණ්ඩය, 01 කලාපය, ජනවාරි - මාර්තු, 2000, 39-40 පි.

ක්‍රමය (2) කර්තෘ, ප්‍රකාශිත වර්ෂය, ලිපිනාමය, සඟරාවේ නම, වෙළුම හා අංකය, අදාළ පිටු අංක

නිදසුන් : අමරසේකර, ගුණදාස (2000), මාර්ටින් වික්‍රමසිංහ හා සිංහල සිනමාව, **සදිසි**, 01 කාණ්ඩය, 01 කලාපය, 39 - 40 පි.

සඟරාවේ නම තද කළු අකුරින් යෙදීම හෝ සඟරාවේ නමට යටින් ඉරක් යෙදීම කළ යුතුය.

## 3.3 පාරිභාෂික පදමාලාව

ග්‍රන්ථයෙහි අන්තර්ගත විෂයය සඳහා භාවිත වන තාක්ෂණික පදවලට අදාළ ඉංග්‍රීසි හෝ සිංහල වචනය අකාරාදි පිළිවෙළින් සඳහන් කළ යුතුය.

මෙය විශේෂයෙන් ශාස්ත්‍රීය ග්‍රන්ථ සඳහා යොදා ගැනේ.

නිදසුන් :

| | |
|---|---|
| අක්ෂාංශය | Latitude |
| අගණනීය | Innumerable |
| ආකල්පය | Attitude |
| ඇටි කුකුළා | Kingcrow |
| ඉත්තෑවා | Porcupine |
| උපකල්පනය කරනවා | Assume |
| ඒක විෂයය | Monograph |
| කලාපය | Zone |
| ගිම්හාන තරණය | Aestivation |
| ජවය | Agility |

## 3.4 සූචිය

මෙය අනුක්‍රමණිකාව ලෙස ද හැඳින්වේ. එක් පිටුවක තීරු දෙකක් වන සේ අනුක්‍රමණිකාව සකස් කළ හැකිය. අදාළ වචනයට ඉදිරියෙන් එය සඳහන් පිටු අංකය හෝ පිටු අංක දැක්විය යුතුය. අනුක්‍රමණිකාව සකස් කළ යුත්තේ අකාරාදි පිළිවෙළටය. අන්තර්ගතය සඳහා යොදාගත් අකුරු ප්‍රමාණයට වඩා පොයින්ට් 02 ක් කුඩා අකුරු යොදා ගැනීම සුදුසුය.

මෙය විශේෂයෙන් ශාස්ත්‍රීය ග්‍රන්ථ සඳහා යොදා ගැනේ.

නිදසුන් :

| | | | |
|---|---|---|---|
| අංගොඩ | - 194 | උඩ පළාත | - 344 |
| ඇතුගල්පුර | - 40,41,42,43 | උඩරට | - 156,343 |
| ඉන්දියාව | - 105,132,133 | උඩරට රාජ්‍යය | - 173 |
| ඉසිපතනය | - 288 | ඕලන්ද රාජ්‍යය | - 234 |
| උදුන්දොර | - 50,119 | | |

# 4. අකුරු ප්‍රමාණ

ග්‍රන්ථයෙහි ස්වරූපය, විෂයය හා ඉලක්ක පාඨක කණ්ඩායම අනුව සුදුසු ප්‍රමාණයේ අකුරු යොදා ගත යුතුය. ග්‍රන්ථ මුද්‍රණයේ දී සාමාන්‍යයෙන් භාවිත කරනු ලබන්නේ පොයින්ට් 12 ක අකුරු ප්‍රමාණයයි. ඊට අමතරව ග්‍රන්ථයෙහි ප්‍රමාණයට අනුව පොයින්ට් 11 සහ පොයින්ට් 10 අකුරු ප්‍රමාණයන් ද යොදා ගත හැකිය. සාමන්‍යයෙන් කුඩා ළමුන් සඳහා (වයස අවුරුදු 10 හෝ ඊට අඩු) ලොකු අකුරු, එනම් පොයින්ට් 14 හෝ 16 යොදා ගැනේ.

සාමාන්‍ය ශාස්ත්‍රීය ග්‍රන්ථ සඳහා පොයින්ට් 10 ප්‍රමාණයේ අකුරු ද ප්‍රබන්ධ කෘති සඳහා පොයින්ට් 12 ප්‍රමාණයේ අකුරු ද යොදා ගැනීම සිදුවේ. එකම කෘතියක වුව ද මුල දී දක්වා ඇති අන්දමට අධෝ ලිපි (footnotes) සඳහා කුඩා අකුරු යොදා ගැනීම සිදු කළ යුතුය.

# 5. පිටු අංක යෙදීම


5.1 ග්‍රන්ථයෙහි මුල් පිටු සඳහා (පෙරවදනෙන් පටන් ගෙන පළමුවන පරිච්ඡේදයෙහි පළමුවන පිටුව දක්වා) රෝම ඉලක්කම් යෙදිය යුතුය. පෙරවදනට පෙර ඇති පිටු සඳහා ද පිටු අංක වෙන් කිරීම සිදු වුවද. එම අංක මුද්‍රණය කිරීමක් සිදු නොවේ.

5.2 අරාබි ඉලක්කම් යෙදීම අන්තර්ගතයෙහි පළමු පරිච්ඡේදයේ පළමුවන පිටුවෙන් ආරම්භ කළ යුතුය. පිටු අංක 1 පළමුවන පිටුවෙහි මුද්‍රණය කිරීම සිදු නොවේ. දෙවන පිටුව, එනම් අංක 2 සිට අංක මුද්‍රණය කිරීම ආරම්භ කළ යුතුය. පරිච්ඡේදයක් ආරම්භයේ දී ද මෙම ක්‍රමය ම අනුගමනය කළ යුතුය

5.3 අන්තර්ගතයෙහි අවසාන පරිච්ඡේදයේ අවසාන පිටුවට පසුව එන ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය, අනුක්‍රමණිකාව, උපග්‍රන්ථ වැනි කොටස් සඳහාත් අරාබි ඉලක්කම් යෙදිය යුතුය. මෙම ඉලක්කම් අන්තර්ගතය සඳහා යෙදූ ඉලක්කම් තවදුරටත් ඉදිරියට ගෙන යාමක් විය යුතුය.

5.4 පිටු අංකය පිටුවෙහි මුද්‍රණය කරන ස්ථානය විවිධ වේ. එනම්, පිටුවේ ඉහළ හෝ පහළ දෙකෙළවර නැතහොත් ඉහළ හෝ පහළ පිටුවේ මැද යන ස්ථානවලය. කෙසේ වෙතත් මෙම ක්‍රම මිශ්‍රව භාවිත කළ නොහැකි අතර එක් කෘතියක් සඳහා එක් නිශ්චිත ක්‍රමයක් පමණක් අනුගමනය කළ යුතුය.

නිදසුන් :



# 6. පිටකවරය සකස් කිරීම

6.1 පිටකවරය සුදුසු 250 gsm කඩදාසියක සකස් කළ හැකිය.

6.2 පිටකවරයෙහි ඉදිරිපස පිටුවෙහි, ග්‍රන්ථ නාමය සමග කර්තෘගේ, සම්පාදකගේ හෝ සංස්කාරකගේ නාම සඳහන් කළ යුතුවේ. ග්‍රන්ථය පරිවර්තනයක් නම්, එහි මුල් කර්තෘ, පරිවර්තිත ග්‍රන්ථනාමය සඳහන් කළ යුතුය. පරිවර්තකගේ නම සඳහන් නොකිරීම පිළිගත් සම්ප්‍රදාය වේ. අවශ්‍යනම් මුල් ග්‍රන්ථනාමය ද සඳහන් කළ හැකිය.

6.3 පිටකවරයෙහි ඉදිරිපස පිටුවෙහි පසු පිට හිස් පිටුවක් විය යුතුය.

6.4 පසුපස පිට කවරයෙහි පහත සඳහන් තොරතුරු ඇතුළත් කළ යුතුය.
අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය මෙන්ම බාර් කෝඩ් සටහන ද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙහි ප්‍රකාශන අංශයෙන් ලබාගත හැකිය.

- පසුවදන - ග්‍රන්ථයෙහි අන්තර්ගතය පිළිබඳව කෙටි හැඳින්වීමක්
- අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN) සහ බාර් කෝඩ් සටහන (Barcode)
- ග්‍රන්ථයෙහි වෙළඳ මිල
- ප්‍රකාශකගේ නම සහ ලිපිනය (අවශ්‍ය නම්)

6.5 පසුපස පිටකවරයෙහි ඇතුළත පිටුව හිස් පිටුවක් විය යුතුය.

6.6 ග්‍රන්ථයෙහි නාරටියේ කර්තෘ හා ග්‍රන්ථ නාමය සඳහන් කළ යුතුය.

6.7 ග්‍රන්ථය සඳහා දූවිලි කවරයක් (Dust Cover) යොදන්නේ නම්,

පිටකවරයෙහි ඉදිරිපස හා පසුපස සඳහන් කළ යුතු සියලුම තොරතුරු දූවිලි කවරයෙහි ද ඉදිරිපස හා පසුපස පිළිවෙළින් සඳහන් කළ යුතුය. එහි ඉදිරිපස ඇතුළතට නැවෙන කොටස ග්‍රන්ථයෙහි අන්තර්ගතය පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීම සඳහාත්, පසුපස ඇතුළතට නැවෙන කොටස කර්තෘ පිළිබඳ හැඳින්වීමක් කිරීම සඳහාත් යොදා ගත හැකිය.

IBSN 978-955-8383-78-0

9 789558 383780

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත,
කොළඹ 07.

මිල රු. 150.00

මුද්‍රණය : සීපී ප්‍රින්ටර්ස්, අංක 204සී, දුම්රිය පොළ පාර, උඩහමුල්ල, නුගේගොඩ.